# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2164/14 - 2020 පෙබරවාරි මස 25 වැනි අඟහරුවාදා - 2020.02.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : BD/UP/LND.1/UO/1/10/03.

*ඉඩම් අමාත්‍යංශයේ අංකය* : 4/3/9/2011/IR/07.

උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ අවතැන් වූවන් පදිංචි කිරීම සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/පරවශතාව ලබා ගැනීමට රජය අදහස් කරන බැවි 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩම්වල විස්තර:*

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, ඌවපරණගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දෙහිවිනි පළාත කෝරළයේ, පහළ කොටවෙර ග්‍රාම නිළධාරි වසමෙහි, පහළ කොටවෙර අවසාන ගම් සිතියම් අංක 388 අතිරේක අංක 21 හි පත්‍ර අංක 22 දරන ඉඩම් කැබලි තුන (03) සඳහා පිළියෙල කරන ලද 2019.06.26 වැනි දිනැති මූලික පිඹුරේ දක්වා ඇති හෙක්ටයාර් 0.1901 ක් වූ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණවලින් යුතු ඉඩම් කැබලිවලට මායිම් :

01. කැබලි අංක 843
ඉඩමේ නම: බඩල්දෙකේකුඹුර; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: වැලිමඩ, පහළ කොටවෙර, කිරවනාගල්වත්තහි පදිංචි ඒ. එම්. ඉෂාරා සෙව්වන්දි මිය සහ ආර්. එම්. අනුෂා දීපිකා කුමාරි මිය; ඉඩම් ප්‍රමාණය: හෙක්ටයාර් 0.0519.

02. කැබලි අංක 844
ඉඩමේ නම: බඩල්දෙකේකුඹුර; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: වැලිමඩ, පහළ කොටවෙර, කිරවනාගල්වත්තහි පදිංචි ඩබ්. එම්. මාලනී; ඉඩම් ප්‍රමාණය: හෙක්ටයාර් 0.0270.

03. කැබලි අංක 845
ඉඩමේ නම: ගනිල්ලේකුඹුර, බඩල්දෙකේකුඹුර; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: වැලිමඩ, පහළ කොටවෙර, කිරවනාගල්වත්තහි පදිංචි ඩී. එම්. සුදුබණ්ඩා මයා; ඉඩම් ප්‍රමාණය: හෙක්ටයාර් 0.1112.

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම එකී හිමිකම්,


1A - G 32088 - 27 (2020/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගතකළ හැක.*

අයිතිවාසිකම් හෝ සම්බන්ධකම් ඉදිරිපත් කිරීම පිණිස තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය පැවරුණු අයවලුන් හෝ පහත සඳහන් දිනයන්හි ඒ ඒ ඉඩම් කැබලි අංක සඳහා පහත නියම කර ඇති වෙලාවට ඌවපරණගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

| *දිනය* | *වේලාව* | *කැබලි අංක* |
|---|---|---|
| 2020.03.26 | පෙ.ව. 9.30 | 843 සිට 845 දක්වා |

තවද, 2020.03.26 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම්/පරවශ්‍යතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳව විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය.

එම්. එම්. පුෂ්පකාන්ති,
ප්‍රාදේශීය ලේකම්,
ඌවපරණගම.

2020 පෙබරවාරි මස 20 වැනි දින,
ඌවපරණගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

03 - 239

## ශුද්ධි පත්‍රිකාව

### 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : ඩීඑස්ඕ/එච්ඕඑම්/එල්ඒසී/88/II.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/6/2014/එච්ඩබ්/II.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියට යටත්ව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2048/38 හා 2017.12.07 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ 6ඒ පිටුවේ පළ කර ඇති කැබලි අංක 323 යන්න 322 වශයෙන් පහත සඳහන් පරිදි සංශෝධනය කරන බව මෙයින් දැනුම් දෙමි.

01. **කැබලි අංක 322**

ඉඩමේ නම: කිරිපෙනෙල්ලගහලන්ද, ගොඩපරගහලන්ද, ගොරකගහවත්ත, හතර අඳ හේන; ඉඩමේ විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: බෝමිරියගේ විරාජ් ප්‍රසන්න, අංක 308/17/4, මාගම්මන, හෝමාගම; ප්‍රමාණය: හෙක්. 0.0031.

ප්‍රාදේශීය ලේකම්,
හෝමාගම.

2020 ජනවාරි මස 20 වැනි දින,
ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය,
හෝමාගම.

03-366

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.